සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)**
**Year End Evaluation - 2024 (2025)**

ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: **ගණිතය** | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි

නම / பெயர் / Name: ..........................................................................................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..................................

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමිවේ.

(1) රූපයේ දැක්වෙන්නේ සමාන්තරාස්‍රයකි. එහි ඇති සමමිතික අක්ෂ ගණන කීයද?



(2) විහිදුවා ලියන්න.

$5^2 \times x^2 =$ ..........................................................................................

(3) 2, -3, 1, 0, 3, -2 මෙම සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියන්න.

(4) රූපයේ දී ඇති කෝණය නම් කරන්න.




(5) 5 හි $\frac{1}{5}$ ඒවා කීයක් තිබේද?

(6) 3 වන ත්‍රිකෝණ සංඛ්‍යාව = 3 + 2 + 1 = 6 නම්, 7 වන ත්‍රිකෝණ සංඛ්‍යාව කීයද?

(7) 4 : 2 : 6 අනුපාතය සරලම ආකාරයෙන් ලියා දක්වන්න.

(8) හිස්තැන් සම්පූර්ණ කරන්න.

(1) තිරස් අක්ෂය ........................................................ ලෙස නම් කර ඇත.

2) සිරස් අක්ෂය ........................................................ ලෙස නම් කර ඇත.




(9) $\frac{527}{100} = 5.27$ නම්, $\frac{527}{10}$ හි අගය සොයන්න.

(10) 6562☐ මෙම සංඛ්‍යාව ඉතිරි නැතිව 3 න් බෙදීමට නම්, හිස්කොටුව සඳහා යෙදිය හැකි ඉලක්කමක් ලියන්න

(11) 24 හා 32 යන සංඛ්‍යාවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

(12) සුළු කරන්න. $8 + 28 \div 7 \times 5 - 9$

(13) ලිතුම්ගේ වයස ඇයගේ නංගීගේ වයසට වඩා අවුරුදු 03 මාස 01 දින 12 කින් වැඩිය. නංගීගේ උපන්දිනය 2011.02.16 නම්, ලිතුම්ගේ උපන්දිනය කවදාද?

(14) රූපයේ දැක්වෙන ත්‍රිකෝණය කෝණ අනුව වර්ග කළවිට කුමන වර්ගයේ ත්‍රිකෝණයක්දැයි සඳහන් කරන්න.




(15) $2x + 1 = 11$ සඳහා දී ඇති ගැලීම් සටහන සම්පූර්ණ කරන්න.




(16) සුළු කරන්න. $\frac{1}{2} + \frac{1}{6}$

(17) ග්‍රෑම් 100 ක ස්කන්ධයක් ඇති බෑගයකට බිස්කට් පැකට් 30 ක් දැමූවිට, එහි ස්කන්ධය ග්‍රෑම් 2500 ක් වේ. බිස්කට් පැකට් එකක ස්කන්ධය සොයන්න.

(18) රූපයේ දැක්වෙන්නේ පරිමිතිය 56 cm ක් වූ සමචතුරස්‍රාකාර තහඩුවකි. එම තහඩුවෙන් කපාගතහැකි විශාලතම වෘත්තයේ අරය කීයද?



(19) 243 සංඛ්‍යාව, පාදය 3 වූ දර්ශක අංකනයෙන් ලියා දක්වන්න.

(20) රූපයේ දක්වෙන්නේ කවර වර්ගයේ ටෙසලාකරණයක්ද?



## II - කොටස

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය සඳහා ලකුණු 16 ක්ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින්ද හිමිවේ.

(01) එදිනෙදා ජීවිතයෙදී අනුපාත සම්බන්ධවන අවස්ථා පිළිබඳව අවධානය යොමුකරමු.

(*a*) (i) එදිනෙදා අනුපාත යොදා ගැනෙන අවස්ථා 2 ක් ලියන්න.

(ii) රසකැවිලි වර්ගයක් සෑදීමේදී පිටි, සීනි හා බටර් පිළිවෙලින් 1 kg, 500 g හා 250 g ලෙස මිශ්‍ර කරයි. යොදන ලද පිටි, සීනි හා බටර් අතර අනුපාතය සරලම ආකාරයෙන් ලියන්න.

(iii) ඉහත රසකැවිලි වර්ගයේ මුළු මිශ්‍රණය 2100 g ක් සාදාගැනීමට අවශ්‍ය පිටි, සීනි හා බටර් ප්‍රමාණ වෙන වෙනම සොයන්න.

(*b*) පරිසරය අලංකාරණය සඳහා ටෙසලාකරණය යොදාගනී.

(i) ටෙසලාකරණයක් නිර්මාණයේදී සැලකිය යුතු කරුණු 2 ක් ලියන්න.

(ii) ඔබ කැමති අර්ධ ශුද්ධ ටෙසලාකරණයක් නිර්මාණය කරන්න.

(iii) හිස්තැනට එන අගය ලියා දක්වන්න.

සරල රේඛීය තලරූප භාවිතයෙන් කරනු ලබන ටෙසලාකරණවල ශීර්ෂ ලක්ෂ්‍යයක් වටා කෝණවල එෙක්‍යය ........................................... කි.

(02) (i) කාටීසීය තලයක් ඇඳ පහත දී ඇති ලක්ෂ්‍යය ලකුණු කර එම ලක්ෂ්‍යය අනුපිළිවෙලට සරල රේඛා ඛණ්ඩවලින් යා කරමින් ආරම්භක ලක්ෂ්‍යය කරා පැමිණෙන්න.

A (0 , 0) B (6 , 0) C (6 , 4) D (0 , 4)

(ii) ඉහත ලක්ෂ්‍යය යා කල විට ලැබුණු තල රූපය හඳුන්වන නම කුමක්ද?

(iii) එම තලරූපයේ සමමිති අක්ෂ ඇඳ දක්වන්න.

(iv) ඉහත සමමිති අක්ෂ හමුවන ලක්ෂ්‍යය P ලෙස නම් කර P හි ඛණ්ඩාංක ලියන්න.

(03) (*a*) (i) 5 cm දිග AB සරල රේඛා ඛණ්ඩයක් නිර්මාණය කරන්න. එය පාදයක් වනසේ ABC සමපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

(ii) AB රේඛාවට සමාන්තර රේඛාවක් C හරහා අඳින්න.

(*b*) (i) ස්ථිතික කෝණයක් හා ගතික කෝණයක් සඳහා උදාහරණ 01 බැගින් ලියන්න.

(ii) පරාවර්ත කෝණයක් ඇඳ එය $P\hat{Q}R$ ලෙස නම් කරන්න.

(iii) ඉහත (ii) හි අඳින ලද කෝණයේ ශීර්ෂය හා බාහු නම් කරන්න.

(04) (i) ත්‍රිකෝණාකාර මුහුණත් අඩංගු ඝනවස්තු 2 ක් නම් කරන්න.

(ii) ඉහත නම් කල ඝන වස්තු අතරින් එක් ඝනවස්තුවක පතරමක දල සටහනක් අඳින්න.

(iii) ඉහත පතරමට අදාල ඝන වස්තුවේ මුහුණත්, දාර හා ශීර්ෂ ගණන කොපමණද?

(iv) ඔයිලර් සම්බන්ධය ලියා දක්වන්න.

(v) ඉහත (iii) හි සඳහන් කල ඝන වස්තුව ඔයිලර් සම්බන්ධය හා ගැලපෙන බව පෙන්වන්න.

(05) එක්තරා පාසලක දෙවනවාර විභාගයේදී 7 ශ්‍රේණියේ සිසුන් විෂයයන් කීපයක් සඳහා ලකුණු ලබාගත් ආකාරය අනුව පහත වගුව සකසා ඇත.

48713

| විෂයය | ලකුණු 40 ට අඩු | ලකුණු 40 ට වැඩි |
|---|---|---|
| ගණිතය | 15 | 25 |
| සිංහල | 05 | 35 |
| විද්‍යාව | 10 | 30 |

Learning Resource Center R De Mazenod College Kandana

(i) ඉහත වගුවේ තොරතුරු නිරූපණය සඳහා බහු තීර ප්‍රස්තාරයක් අඳින්න.
(ii) 7 ශ්‍රේණියේ සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?
(iii) තීර ප්‍රස්තාරය අනුව සාධන මට්ටම අඩු විෂය කුමක්ද?

(06) (*a*) තමාලි ඇය සතු මුදලකින් $\frac{1}{4}$ ක් ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීමටද, 24% ක් ඇඳුම් මිලදී ගැනීමටද, වියදම් කර ඉතිරිය වූ 0.51 ක් බැංකුවක තැන්පත් කරයි.
(i) ලිපි ද්‍රව්‍ය සඳහා වියදම් කල මුදල ඇය සතු මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.
(ii) ඇය බැංකුවේ තැන්පත් කල මුදල මුළු මුදලේ ප්‍රතිශතයක් ලෙස දැක්වූ විට කීයක් වේද?
(iii) තමාලි අඩුම මුදලක් යොදාගන ඇත්තේ කුමන කටයුත්තක් සඳහාද? හේතු දක්වන්න.

(*b*) සුළු කරන්න.

$2\frac{1}{6} - 1\frac{3}{4}$

(*c*) (-3) + (-2) හි පිළිතුර සංඛ්‍යා රේඛාව භාවිතයෙන් සොයන්න.

(07) (*a*) සෘජු කෝණාස්‍රයක පළල ඒකක *a* ද, එහි දිග පළලට වඩා ඒකක 3 කින්ද වැඩිවේ නම්,
(i) සෘජු කෝණාස්‍රයේ දිග සඳහා වීජීය ප්‍රකාශනයක් ගොඩ නගා සුළු කරන්න.
(ii) සෘජුකෝණාස්‍රයේ පරිමිතිය P සඳහා සූත්‍රයක් ගොඩනගන්න.
(iii) *a* = ඒකක 10 නම් P හි අගය සොයන්න.

(*b*) A = {election යන වචනයේ අක්ෂර}
(i) A කුලකය අවයව සහිතව ලියා දක්වන්න.
(ii) A කුලකයට අයත් අවයව සඳහන් කල කාඩ්පත් සහිත පෙට්ටියකින් කාඩ්පතක් ඉවතට ගත්තේ නම් පහත සිදුවීම්, ස්ථිරව සිදුවන සිදුවීමකි. ස්ථිරවම සිදුනොවන සිදුවීමකි. අහඹු සිදුවීමකි යන්න සඳහන් කර දක්වන්න.
(a) ලැබෙන අක්ෂරය t වීම.
(b) ලැබෙන අක්ෂරය ඉංග්‍රීසි අක්ෂරයක්වීම.
(c) ලැබෙන අක්ෂරය m වීම.